# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2053/4 - 2018 ජනවාරි මස 08 වැනි සඳුදා - 2018.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* 4/1/5/29

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2016/WS/332

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 832, ගංගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ, කොට්ඨාශ අංක 1, ගංගොඩ ගමේ (කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ) පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින්, මැන සකස් කරන ලද, 2017.11.10 දිනැති, කැඩැස්තර සිතියම් අංක: 420371 කලාප අංක: 01 පත්‍ර අංක: 4 දරන පිඹුරේ කැබලි අංක 153 වශයෙන් දැක්වෙන 'කුඹල් කොටුවේ වත්ත' නැමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0354 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංක 153**

**ඉඩමේ නම:** කුඹල් කොටුවේ වත්ත; **ප්‍රමාණය:** හෙක්. 0.0354 **මායිම්:** උතුරට: ආනන්ද හමංගොඩ මාවත සහ කැබලි අංක 154; නැගෙනහිරට: කැබලි අංක 154 සහ කැබලි අංක 148; දකුණට: කැබලි අංක 148 සහ කැබලි අංක 152; බටහිරට: කැබලි අංක 152 සහ ආනන්ද හමංගොඩ මාවත.

හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය :
සන්රී ඇඩ්වර්ටයිසින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 301,
පුත්තලම් පාර,
කුරුණෑගල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2018 පෙබරවාරි මස 26 වැනි දින පෙ.ව. 10.30ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2018 පෙබරවාරි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ආර්. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2018 ජනවාරි මස 03 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුරුණෑගල.

01-594


1A - G 26903 - 22 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.